(ආ) ණය සහතිකයේ වලංගු භාවය රඳා පවතිනුයේ උකස් ඔප්පුව නිසි පරිදි අත්සන්කොට ලියාපදිංචි කර ඇති බවට සහතිකයක් සහ වාහනය බැංකුවට උකස් කර ඇති බවට සටහනක් සහිතව වාහනයේ ලියාපදිංචි සහතිකය ණය මුදල නිදහස් කළ දින සිට දින 90 ක් ඇතුළත ස. ණ. ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම මතය. තවද, වාහනයේ ලියාපදිංචි සහතිකය ණය මුදල ගෙවා නිම කරන තුරු තමන් භාරයේ තබා ගන්නා බවට පොරොන්දුවක් ස. ණ. ආයතනය විසින් දිය යුතුය.

(ඇ) සුමක ක්‍රමය යටතේ මෙන් නොව, මෙම ණය සහතික ක්‍රමය යටතේ හිමිකම් අයදුම්පතක් ඉදිරිපත් කළ විගස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම වගකීමෙන් සියයට 50 නොඉක්මවන ප්‍රමාණයක් ණය මුදල අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජිත ක්‍රියා මාර්ගයන් ගැනීමට අසමත් වන්නේ නම් එසේ ගෙවන ලද මුදල ස. ණ. ආ. විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය යන කොන්දේසිය මත ගෙවනු ලැබේ.

(ඈ) ස. ණ. ආ. යේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් නොමැතිව බස් රථයේ අයිතිය වෙනත් පාර්ශ්වයකට පැවරීමෙන් ණය සහතිකය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම අහෝසි වනු ඇත.

මෙම අමතර කොන්දේසි පනවා ඇත්තේ ණය සහතික ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැරීමට සිදුවන වැඩි අවදානමින් ආරක්ෂාවීම සඳහාය. මෙම ණය සහතික ක්‍රමය යටතේ ඇති වියහැකි අවදානම දැරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පොදු සංචිතයෙන් රුපියල් දශ ලක්ෂ 22 ක් වෙන් කිරීම මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙල

රටෙහි පැවැති නොසන්සුන් තත්වය හේතුවෙන් 1989 වර්ෂය තුළදී අත්හිටුවන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙල 1990 වසරේදී නැවත ආරම්භ කරන ලදී. ඒ අනුව එම වසර තුළදී වැඩමුළු 3 ක් ක්‍රියාත්මක කරන ලදී. ස්වයං රැකියා අවස්ථා ගැන, පාසැල් හැර යන්නන් සහ ජනසවිලාභීන් අතර දැනුවත් කිරීමක් ඇති කිරීමේ අරමුණ පෙරදැරි කරගත් පළමු වැඩමුළු දෙක නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි පවත්වන ලදී. 1990 ජූලි මස නුවරඑළිය දිස්ත්‍රික්කයේ පැවැත්වූ පළමු වැඩමුළුවට 100 ක් දෙනා සහභාගි වූ අතර, 1990 ඔක්තෝබර් මාසයේ ගලේවෙල පැවැත්වූ වැඩමුළුවට 125 දෙනෙක් සහභාගි වූහ. පවත්නා ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයන්ගේ කළමනාකරණ සහ තාක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා යොමු වූ තෙවන වැඩමුළුව 1990 දෙසැම්බර් මස මහනුවර දිස්ත්‍රික්කයේ පැවැත්වූ අතර, ඊට ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත හිමියන් 30 ක් සහභාගි විය. මෙම සියළුම වැඩමුළු පවත්වන ලද්දේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිවය.

## ග්‍රාමීය ණය

විදේශීය ආයතන විසින් අරමුදල් සපයන ලද පහත සඳහන් ණය යෝජනා ක්‍රමයන්හි ණය මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 1990 වසර තුළදී තවදුරටත් කටයුතු කරන ලදී.

1. ආසියානු සංවර්ධන බැංකුවෙන් (ආ. ස. බැං.) අරමුදල් සපයන ලද කිරිඳිඔය වාරිමාර්ග සහ පදිංචි කරවීමේ ව්‍යාපෘතිය—දෙවන අදියර

2. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘ. සං. ජා. අ.) මගින් අරමුදල් සපයනු ලබන බදුල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

3. කෘ. සං. ජා. අ. මගින් අරමුදල් සපයනු ලබන කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

4. ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් අරමුදල් සපයනු ලබන මාතලේ-පුත්තලම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

5. ආ. සං. බැං. අරමුදල් සපයනු ලබන නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය

6. ආ. සං. බැං. අරමුදල් සපයනු ලබන කුඩා තේ ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය

7. ආ. සං. බැං. අරමුදල් සපයනු ලබන කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය

1983–1987 දක්වා වූ ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කරන ලද අරමුදල් ප්‍රමාණයෙන් ප්‍රයෝජනයට නොගෙන ඉතිරිව ඇති අරමුදල් ප්‍රමාණය ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි බදුල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයේ ක්‍රියාත්මක කාලසීමාව 1992 ජූලි මස 31 වන දින දක්වා තවත් වසර දෙකකින් තෙවන වරට ද දීර්ඝ කරන ලදී.

1981 ජුනි මස 29 වෙනි දින ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලද මාතලේ-පුත්තලම දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය වසර 9 ක ව්‍යාපෘති කාලසීමාවකින් පසුව, 1990 ජුනි මස 30 වැනි දින අත්හිටුවන ලදී.

ග්‍රාමීය ණය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව තක්සේරුවක් ලබාගැනීම සඳහාත්, වඩා සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් සකස් කිරීම සඳහා මෙම අංශයේ ණය දෙන ආයතනයන්ට සහායවීම සඳහාත්, තෝරාගත් වාණිජ බැංකු ශාඛාවන්හි කෘෂිකාර්මික ණය ව්‍යුහය පිළිබඳව සහ සමුපකාර ග්‍රාමීය බැංකුවල සාමාන්‍ය වැඩකටයුතු පිළිබඳව අධීක්ෂණය කිරීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය බිල්පත් යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 26 ක වටිනාකමින් යුත් ප්‍රතිග්‍රහණ ණයවර සීමාවන් 19 ක් 1990 වසර තුළදී මහ බැංකුව විසින් අනුමත කරන ලදී. මෙම අනුමත සීමාවලින් අමු තේ දළු මිලදී ගන්නා තේ කම්හල් 3 ක් පමණක් පහසුකම් ලබාගත් අතර, ඔවුන් විසින් ඒ යටතේ නිකුත් කරන ලද දේශීය බිල්පත්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 6 ක් මිළදී ගන්නා ලද අමු තේ දළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 6,93,538 ක් ද වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව, ආසියානු ශාන්තිකර කලාපීය කෘෂිකාර්මික ණය සංගමයේ (ඇප්‍රකා) ශ්‍රී ලංකාවේ අනිකුත් සාමාජික ආයතන තුන සමඟ එක්ව එහි 23 වැනි විධායක කමිටු සැසි වාරය 1990 අගෝස්තු මස පවත්වන ලදී.

## * ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැං.)

1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකර්මය, ගෘහ කර්මාන්ත හා සුළු පරිමාණයේ කර්මාන්ත, ධීවර කර්මාන්තය, වාණිජ්‍යය හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයීම තුළින් ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා. ග්‍රා. සං. බැං.) සිය කාර්යභාරය 1990 වර්ෂයේදී තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

### ප්‍රා. ග්‍රා. සං. බැං. ශාඛා ව්‍යාප්තිය

1990 ඔක්තෝබර් 13 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බදුල්ල දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව පිහිටුවීමත් සමඟ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 12 තෙක් වැඩිවිය. මීට අමතරව, 1990 වසර තුළ නව බැංකු ශාඛා 12 ක් බදුල්ල (බදුල්ල, වැලිමඩ, දියතලාව හා පස්සර) කුරුණෑගල (ඉබ්බාගමුව), හම්බන්තොට (සූරියවැව), පුත්තලම (මුන්දලම සහ නවගත්තේගම), මහනුවර (කටුගස්තොට), නුවරඑළිය (නිල්දණ්ඩාහින්න හා ආගරපතන) සහ මොණරාගල (තණමල්විල) ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් විවෘත කරන ලදී. 1990 වසර තුළදී, ආරක්ෂක හේතු මත, කෑගල්ල ප්‍රා. ග්‍රා. සං. බැංකුවේ පනාවල ශාඛාව, රුවන්වැල්ල ශාඛාව සමඟ ඒකාබද්ධ කරන ලදී. මේ අනුව, 1989 වසර අගදී 89 ක්ව පැවති ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛා සංඛ්‍යාව, 1990 වසර අග වනවිට 100 දක්වා ඉහළ නැගිණි. 1985 වසරේ සිට 1990 වසර අවසානය දක්වා ප්‍රා. ග්‍රා. සං. බැං. හා ඒවායේ ශාඛා ව්‍යාප්තිය සම්බන්ධ විස්තර 2.8 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

2.8 සංඛ්‍යා සටහන

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා ව්‍යාප්තිය

| ප්‍රා. ග්‍රා. සං. බැංකුවේ නම | ප්‍රා. ග්‍රා. සං. බැංකුව ආරම්භකළ දිනය | ප්‍රධාන කාර්යාලය | විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව | | | | | | 1990 අවසානයට එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1985 | 1986 | 1987 | 1988 | 1989 | 1990 | |
| 1. කළුතර | 85·07·13 | බුලත්සිංහල | 4 | 3 | 4 | 1 | — | — | 12 |
| 2. මාතර | 85·07·28 | මාතර | 5 | 2 | — | 1 | — | — | 8 |
| 3. කුරුණෑගල | 85·08·10 | කුලියාපිටිය | 6 | 4 | 2 | 1 | 1 | 1 | 15 |
| 4. අනුරාධපුර | 85·08·12 | මිහින්තලේ | 2 | 4 | 1 | — | — | — | 7 |
| 5. හම්බන්තොට | 86·12·13 | අම්බලන්තොට | | 2 | 2 | 2 | — | 1 | 7 |
| 6. කෑගල්ල | 87·02·08 | කෑගල්ල | | | 8 | 1 | 2 | — | 10* |
| 7. පුත්තලම | 87·07·11 | හලාවත | | | 5 | 1 | — | 2 | 8 |
| 8. ගාල්ල | 87·08·17 | ඇල්පිටිය | | | 1 | 7 | 1 | — | 9 |
| 9. මහනුවර | 87·10·03 | ගම්පොල | | | 6 | 3 | — | 1 | 10 |
| 10. නුවරඑළිය | 88·10·10 | නුවරඑළිය | | | | 1 | 3 | 2 | 6 |
| 11. මොණරාගල | 88·10·11 | බුත්තල | | | | 1 | 2 | 1 | 4 |
| 12. බදුල්ල | 90·10·13 | බදුල්ල | | | | | | 4 | 4 |
| එකතුව | — | — | 17 | 15 | 29 | 19 | 9 | 12 | 100 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* 1990 වර්ෂය තුළදී කෑගල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ පනාවල හා රුවන්වැල්ල ශාඛා ඒකාබද්ධ කිරීමෙන් එම බැංකුවේ ශාඛා සංඛ්‍යාව 1 කින් අඩුවිය.

**තැන්පතු රැස්කිරීම**

ප්‍රා. ග්‍රා. සං. බැං. විසින් 1990 වසර තුළදී,තැන්පතු රාශිකරණයෙහි සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. 1989 වසර අවසානයේදී ගිණුම් 199,559 ක රුපියල් දශ ලක්ෂ 176 ක්ව පැවති ප්‍රා .ග්‍රා. සං. බැං. වල මුළු තැන්පතුවල වටිනාකම, 1990 වසර අවසානය වන විට ගිණුම් 309,616 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 314 ක් දක්වා වැඩිවිය. කලින් වසරේ සියයම 75 ක් වූ වර්ධනය සමඟ සසඳා බලන කල, සියයට 78 ක වාර්ෂික වර්ධනයක් මීන් පිළිබිඹු වේ. නව ශාඛා විවෘත කරමින් ප්‍රා. ග්‍රා. සං. බැං. පහසුකම් ව්‍යාප්ත කිරීමත් සමඟ මින් පෙර බොහෝදුරට බැංකු පහසුකම් නොමැතිව හෝ ඉතා අඩුවෙන් පැවති තම බලප්‍රදේශයන් තුළ වෙසෙනා ග්‍රාමීය ජනතාව අතර ඉතිරිකිරීමේ පුරුද්ද වර්ධනය කිරීම සඳහා එක් එක් ප්‍රා. ග්‍රා. සං. බැංකුව විසින් දරන ලද උත්සාහය, එම බැංකුවල තැන්පතු ගිණුම් සංඛ්‍යාව ඉහළ නැගීම තුළින් පිළිබිඹු කරයි. මෑත අතීතයේ පැවති සාමාන්‍ය ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 1990 වසර අවසානයේදී පැවති මුළු තැන්පතු වලින් සියයට 86 ක් ඉතිරි කිරීමේ තැන්පතු වලින් ද, ඉතිරි සියයට 14 ස්ථිර හා අනෙකුත් තැන්පතු වලින් ද සමන්විත විය. ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීමේ නැමියාවේ වර්ධනයක් පෙන්නුම් කරමින් 1989 දී රු. 882 ක් වූ තැන්පතු ගිණුමක සාමාන්‍ය වටිනාකම, 1990 දී රු. 1,014 දක්වා වැඩි විය. ප්‍රා. ග්‍රා. සං. බැංකුවල ඉතිරිකිරීම් හා ස්ථිර තැන්පතු යන දෙවර්ගයෙහිම තැන්පතු ගිණුමක සාමාන්‍ය වටිනාකම අඩු මට්ටමක පැවතීම, එම බැංකු ග්‍රාමීය අංශයේ වඩා දිළිඳු කොටස් වෙත සමීප වීමට දරා ඇති උත්සාහය පෙන්නුම් කරයි. බැංකුවල තැන්පතු වර්ධනය තවදුරටත්, තහවුරු කරමින් 1989 දී රුපියල් දශ ලක්ෂ 2 ක් වූ ප්‍රා. ග්‍රා. සං. බැංකු ශාඛාවක සාමාන්‍ය තැන්පතු වටිනාකම 1990 දී රුපියල් දශ ලක්ෂ 3.1 දක්වා වැඩි විය.

**ණය සැපයීම**

රට තුළ පැවතියා වූ වඩාත් සන්සුන් වාතාවරණය තුළ, 1990 වසරේදී ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ණයදීමේ කටයුතු සැළකිය යුතු ප්‍රසාරණයක් පෙන්නුම් කර ඇත. 1990 වසර තුළදී ප්‍රා.ග්‍රා.සං.බැං. විසින් දෙන ලද ණය සංඛ්‍යාව 20,640 සිට 47,616 දක්වා ද, දෙන ලද ණයවල මුළු වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 155, රුපියල් දශ ලක්ෂ 430 දක්වා ද වර්ධනය විය. 1990 වසරේදී ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාවේ ඇති වූ සැළකිය යුතු ප්‍රගතියට මූලිකවම හේතු වූයේ ප්‍රා.ග්‍රා.සං.බැං. විසින් ජනසවිලාභීන්ට විශේෂයෙන් ස්වයං රකියා ව්‍යාපෘති ඇරඹීම සඳහා දෙන ලද ණය සංඛ්‍යාව ඉහළ යාමය. ග්‍රාමීය අංශයට ණය සැපයීමේ ක්‍රියාවලියේදී ප්‍රා.ග්‍රා. සං. බැංකුවල අඛණ්ඩ හා වර්ධනාත්මක සහභාගිත්වය මෙයින් පෙන්නුම් කෙරේ. 1989 දී රුපියල් 7,493 ක් වූ දෙන ලද ණයක සාමාන්‍ය වටිනාකම 1990 දී රු. 9,026 දක්වා ද, බැංකු ශාඛාවක ණයදීම් වල සාමාන්‍ය වටිනාකම 1989 දී රුපියල් දශ ලක්ෂ 1.7 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 4.3 දක්වා ද වැඩි විය. මීට අමතරව, 1990 වසර තුළ දී ප්‍රා.ග්‍රා.සං.බැං. විසින් රුපියල් දශ ලක්ෂ 94 ක් රන් භාණ්ඩ උකස් ණය ලෙස ප්‍රදානය කර ඇත. 1989 දී දෙන ලද රුපියල් දශ ලක්ෂ 35 ක් වූ රන් භාණ්ඩ උකස් ණය හා සසඳා බැලීමේදී, මෙය සියයට 166 වර්ධනයකි. කෙසේ වෙතත්, ඇතැම් ප්‍රා. ග්‍රා. සං. බැං. මූලිකවම ආරක්ෂක හේතු මත, උකස් ණය දීමේ කටයුතුවල නිරත නොවීය.

ප්‍රා. ග්‍රා. සං. බැං. විසින් පසුගිය වර්ෂ වලදී මෙන්ම, කෘෂිකාර්මික, ධීවර, සත්ව පාලනය, කුඩා කර්මාන්ත හා වෙළඳාම ඇතුළු විවිධ වූ ආර්ථික කටයුතු වෙනුවෙන් ණය සැපයීම නොකඩවා කරගෙන යන ලදී. 1990 තුළදී ණයදීම් වලින් වැඩි ප්‍රතිශතයක් (65 %) කෘෂිකාර්මික අංශයට ප්‍රදානය කරන ලද අතර, මුළු ණය වලින් සියයට 11 ක් හා සියයට 10 ක් පිළිවෙලින් වෙළඳ හා වාණිජ සහ කුඩා කර්මාන්ත අංශ වලට සපයා ඇත.

## අනෙකුත් කාර්යයන්

සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදය තුළදී ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් අරමුදල් සපයාදීම මගින් ස්වයං රැකියා ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, ගොවි පුහුණු වැඩ සටහන් මෙහෙයවීම, කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා ගොවීන්ට සහාය වීම සහ ප්‍රාදේශීයව තිබෙන සම්පත් පිළිබඳ තොරතුරු රැස්කිරීම ආදී අංශ කෙරෙහි තම කටයුතු ව්‍යාප්ත කෙරිණි. මීට අමතරව, රජය විසින් අනුග්‍රහය දක්වන ලද හා විදේශීය මූල්‍යාධාර ලද විවිධ ණය ව්‍යාපෘතීන් යටතේ, ග්‍රාමීය අංශයේ අඩු වරප්‍රසාද ලැබූවන්ට ණය පහසුකම් ලබාදීමේදී ප්‍රා. ග්‍රා. සං. බැං. විසින් වැදගත් මෙහෙවරක් ඉටු කරන ලදී. ජනසවිය වැඩපිළිවෙල, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියෙන් අරමුදල් සැපයෙන සුළු ගොවීන් හා ඉඩම් නොමැති වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය සහ යුනිසෙෆ් ආයතනයෙන් අරමුදල් සැපයෙන ණය වැඩපිළිවෙල මින් සමහරකි. 1990 පෙබරවාරි මාසයේදී, කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං. බැංකුව සුළු හා මධ්‍යම කර්මාන්ත ණය යෝජනා ක්‍රමය—III (සුමක III) යටතේ සහභාගි ණය දෙන ආයතනයක් වශයෙන් තෝරා ගැනිණ. මෙය සුමක ණය යෝජනා ක්‍රමයට ඇතුළත් කර ගන්නා ලද පළමුවන ප්‍රා. ග්‍රා. සං. බැංකුවයි. 1990 තුළදී කුරුණෑගල ප්‍රා. ග්‍රා. සං. බැංකුව විසින් මෙම ණය වැඩපිළිවෙල යටතේ කෘෂිකර්මය, කර්මාන්ත, සත්ව පාලනය හා වෙළෙඳාම යන අංශ සඳහා රුපියල් දශ ලක්ෂ 4.2 ක වටිනාකමින් යුත් ණය 67 ක් ප්‍රදානය කර ඇත.

කණ්ඩායම් ණය ක්‍රමය, බාල වයස්/පාසල් ළමුන්ගේ තැන්පතු ක්‍රමය, සංවර්ධන තැන්පතු ක්‍රමය, ' ජනහමුව ' සංකල්පය යනාදී වශයෙන් ප්‍රා. ග්‍රා. සං. බැං. විසින් අරඹන ලද අනෙක් නව බැංකු සේවාවන් වසර තුළදී, ගැමි ජනතාව අතර තවදුරටත් ප්‍රචලිත විය. මෙය බැංකුවල ගණුදෙනුකරුවන් සංඛ්‍යාවෙහි සැළකිය යුතු වැඩිවීම තුළින් මනාව පිළිබිඹු වේ.

1990 වසර තුළදී ප්‍රා. ග්‍රා. සං. බැ. වල ණයදීම් තුළින් ආසන්න වශයෙන් 43,000 ක පමණ නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමට හැකි වී ඇත. මේ අනුව, ආරම්භයේ සිට 1990 වසර අග දක්වා ප්‍රා. ග්‍රා. සං. බැ. මගින් දළ වශයෙන් රැකියා අවස්ථා 425,000 ක් පමණ ලබාදී ඇති අතර, ඒ මගින් ග්‍රාමීය අංශයෙහි රැකියා අවස්ථා උත්පාදනය කිරීමට මෙම බැංකුවල දායකත්වය ඉස්මතු කොට පෙන්වයි.

1990 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, ග්‍රාමීය ප්‍රදේශවල බැංකු පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ වෙත ප්‍රා. ග්‍රා. සං. බැං. මෙහෙයවීම සඳහා තවදුරටත් උත්සාහ දරණ ලදී. උපදෙස් සැපයීම හා වරින් වර එකී බැංකුවලට අදළ නියෝග නිකුත් කිරීමට අමතරව මහ බැංකු නිලධාරීහු, සෑම ප්‍රා. ග්‍රා. සං. බැංකුවකටම පාහේ ගොස් එම බැංකුවල වැඩපිළිවෙල විමර්ශනය කිරීමේ කටයුතුවල සහ බැංකු සේවකයින් හා ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවක් දිරි ගැන්වීමෙහි ද නිරත වූහ. මෙම නිලධාරීහු, ව්‍යාපෘති හා ක්ෂේත්‍ර ගමන්වලදී ප්‍රා. ග්‍රා. සං. බැංකු සමහරක් විසින් සංවිධානය කරන ලද, ජනහමුවලට හා ණයලාභීන් පුහුණු කිරීමේ වැඩමුළුවලටද සහභාගි වූහ. බැංකු සේවාවන් ලබා ගැනීමේදී, විශේෂයෙන්ම නිෂ්පාදන කටයුතු සඳහා ණය ලබා ගැනීමේදී, ග්‍රාමීය ජනයා මුහුණපාන අපහසුතාවයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඵලදායී අවස්ථාවක් මෙම ජනහමු තුළින් ලැබෙන බව සනාථ විය. මෙම ණය රැස්වීම් හා ජනහමු වලදී ඉදිරිපත් වූ කරුණු සැළකිල්ලට ගෙන ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට හැකිවීම ග්‍රාමීය අංශයට ණය සැපයීමේදී ඇති ප්‍රධාන බාධක මැඩ පැවැත්වීම සඳහා සැළකිය යුතු අන්දමින් ඉවහල් වී ඇත.

## ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

මහ බැංකුවේ ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය එහි පුහුණු කිරීමේ කටයුතු 1990 වර්ෂය තුළදී තවදුරටත් පුළුල් කරන ලදී. වර්ෂය තුළදී ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය පුහුණු කිරීමේ පාඨමාලා 51 ක් සංවිධානය කොට මෙහෙයවන ලද අතර ඒ සඳහා

1,608 දෙනෙකු සහභාගී වී ඇත. මෙය පසුගිය වසරේ මෙහෙයවනු ලැබූ පාඨමාලා 39 සහ ඒ සඳහා සහභාගී වූ 853 දෙනා සමඟ සසඳන විට කැපී පෙනෙන වර්ධනයක් විය. 1990 දී මෙහෙයවනු ලැබූ පුහුණු පාඨමාලා 51 න් 30 ක් සුළු පරිමාණ ව්‍යවසායකයින් සහ ස්වයං සේවාවන්හි නියුක්ත පුද්ගලයින් 902 දෙනෙකු සඳහා ඔවුන්ගේ ව්‍යවසායකත්ව සහ කළමනාකාරිත්ව දැනුම වර්ධනය කිරීමට පිට පළාත්වල පැවැත්වූ ඒවා විය. මෙම පිරිසෙන් 810 දෙනෙකු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලින් විය. ඉතිරි පුහුණු පාඨමාලා 21, බැංකු සහ ඒ ආශ්‍රිත අංශවල නිලධාරීන් 706 දෙනෙකු පුහුණු කිරීම ඉලක්ක කරගත් අතර, එයින් 428 දෙනෙකු වාණිජ බැංකු වලින් ද, 43 දෙනෙකු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලින් සහ ඉතිරි නිලධාරීන් 139 දෙනා මූල්‍ය සමාගම්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ " සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වූ ණය ව්‍යාපෘතිය " වැනි අනිකුත් මූල්‍ය ආයතන සහ නියෝජිත ආයතන වලින් ද වූහ.

ග්‍රාමීය බැංකු ක්‍රම, ව්‍යාපෘති මූල්‍යකරණ සංවර්ධනය, වාණිජ බැංකු ක්‍රම, ජාත්‍යන්තර වෙළෙඳාම, විනිමය කාර්යාවලින්, කුලී සින්නක්කර හා බද්ද සින්නක්කර මූල්‍යකරණය, කළමනාකරණය, පුහුණුවීම් කරනු ලබන්නන් පුහුණු කිරීම, ව්‍යාපෘති ඇගයීම හා මූල්‍යකරණය සහ සන්නිවේදනය හා සුළු පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය, 1990 වර්ෂය තුළදී පුහුණුවීම් සලසනු ලැබූ මූලික ක්ෂේත්‍රයන් විය. අවසානයට සඳහන්ව ඇති පුහුණුවීම් ක්ෂේත්‍ර 4, ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ පුහුණු වැඩසටහනට සම්පූර්ණයෙන්ම අළුතින් එකතු කරන ලද ඒවා විය. 1990 වර්ෂය සඳහා නියමිත වූ පාඨමාලාවලට අමතරව, විශේෂ ඉල්ලීම් මත, විද්‍යාලය මගින් විශේෂ පුහුණු පාඨමාලා කිහිපයක් පවත්වන ලදී. මෙම පුහුණු පාඨමාලාවලට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ණය නියාමක ව්‍යාපෘතියේ නියුක්ත වූවන් සඳහා වූ පුහුණු පාඨමාලාවන්, " කුඩා ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා ණය ව්‍යාපෘති " වලට සම්බන්ධ නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන්, ශ්‍රී ලංකා ස්වයංක්‍රිය නිෂ්කාශණාගාරය පිළිබඳ පුහුණු වැඩ සටහන් හා විදේශීය විනිමය පිළිබඳ සම්මන්ත්‍රණ සහ මුදල් වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳපොළ ව්‍යුත්පන්නයන් සහ උපකරණ පිළිබඳ පාඨමාලාවන් ඇතුළත් විය. අවසානයට සඳහන් කළ පාඨමාලාව ශ්‍රී ලංකාවේ වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයෙන් සහ ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයෙන් සමන්විත වූ සංවිධානයක විශේෂ ඉල්ලීම මත පවත්වනු ලැබීය.

වර්ෂය තුළදී, ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය, පුහුණු පාඨමාලාවන් සහ ඒවායේ අඩංගු කරුණු පිළිබඳ නිශ්චිත අරමුණක් ඇතිව පුහුණු පාඨමාලා දින දර්ශනයක් ප්‍රසිද්ධියට පත් කිරීමෙන් පුහුණුවීම් සම්බන්ධව වැඩිවෙමින් පවතින ඉල්ලුමට අනුග්‍රහය දක්වූ අතර විද්‍යාලය මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා වලින් තෝරාගත් පාඨමාලාවන් කිහිපයක් පිළිබඳ වාර්තා ප්‍රසිද්ධියට පත් කරන ලදී. මෙම වාර්තා මගින් දිස්ත්‍රික් සහ ග්‍රාමීය මට්ටමේ අනිකුත් ආයතනවල පුහුණුවීම් කරන්නවුනට මෙයට සමාන පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදෙනු ඇත. විද්‍යාලයේ 9 වන සංවත්සර දේශනය " මිනිස් අවශ්‍යතා මුදුන් පමුණුවාලීම සඳහා බැංකු ප්‍රතිපත්තිය ප්‍රති සැකසුම " යන මැයින් ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය එච්. එන්. එස්. කරුණාතිලක මහතා විසින් 1990 අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලදී.

## සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් (සේ. අ. අ.) පනතට අනුව දායක සහ අධිභාර මුදල් ලබාගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ආදායම් ලබාගැනීම, අරමුදලේ ලියාපදිංචි සේව්‍යයන්ගේ හා ඒ ඒ සාමාජිකයින්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටිනු

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථ සාධක අරමුදල් අංශය සමඟ සමීප සහයෝගීතාවයකින් යුතුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මෙම කාර්යයන් කරගෙන යනු ලැබේ.

## දායක මුදල්

1989 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 3,021.7 ක් හා සසඳන විට 1990 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,909.5 ක් විය. මෙය කලින් වර්ෂයේ ලැබුණු දායක මුදල් ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 887.8 කින් හෙවත් සියයට 29.4 කින් වැඩි වීමකි.

## සාමාජිකයින්ගේ ශේෂ

සමාලෝචනයට ලක්වී ඇති වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1990 දෙසැම්බර් 31 දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු එකතුව රුපියල් දශ ලක්ෂ 36,297.7 ක්ව පැවැති අතර එය 1989 පැවැති ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 5,940.1 කින් හෙවත් සියයට 19.6 කින් වැඩිවීමකි.

## ආයෝජන

1989 වර්ෂයේ ආයෝජනය කළ රුපියල් දශ ලක්ෂ 8,897 සමඟ සසඳා බලන කල සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී රජයේ සුරැකුම්පත්, ජාතික ආරක්ෂක බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු බැඳුම්කරවල ආයෝජනය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 11,044.7 කි. මෙය 1989 වර්ෂයේ ආයෝජන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 2,147.5 ක වැඩිවීමකි. අරමුදල විසින් 1990 දෙසැම්බර් 31 දින වන විට ආයෝජනය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 38,466.7 වන අතර එය 1989 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 6,192.7 කින් ඉහළ යෑමකි. රාජ්‍ය ආයෝජන සහ උකස් බැංකු බැඳුම්කරවල ආයෝජනය කළ රුපියල් දශ ලක්ෂ 100 ක් ද මෙම වැඩිවීමෙහි ඇතුළත් ය.

## ආයෝජනවලින් ලද ආදායම

1990 දී ආයෝජනවලින් ලත් ආදායම රුපියල් දශ ලක්ෂ 4,187.7 ක් වූ අතර එය 1989 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 3,425.8 සමඟ සසඳන විට රුපියල් දශ ලක්ෂ 761.9 ක වැඩිවීමකි. ආයෝජන ආදායමින් අඩු කරන ලද මුළු රඳවා ගැනීමේ බද්ද 1990 දී රුපියල් දශ ලක්ෂ 418.0 ක් විය.

## ප්‍රතිලාභ ගෙවීම

1989 වර්ෂයේ ගෙවන ලද රුපියල් දශ ලක්ෂ 632.7 හා සසඳන විට 1990 වර්ෂය තුළදී සාමාජිකයින්ට ගෙවන ලද මුළු ප්‍රතිලාභ මුදල රුපියල් දශ ලක්ෂ 1,200.4 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 576.7 ක හෝ සියයට 91.2 ක වැඩිවීමක් වාර්තා කරයි. සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළ ගෙවනු ලැබූ ප්‍රතිලාභ සංඛ්‍යාව 44,813 ක් වූ අතර, එය 1989 වර්ෂයේදී 26,287 ක් විය.

## සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා වූ පොළිය

සේවක අර්ථසාධක අරමුදල විසින් සෑම වර්ෂයකම අවසානයට සාමාජිකයින්ගේ ගිණුම්වල ඇති ශේෂයන් සඳහා අරමුදලේ ආයෝජනයන් මගින් ලැබෙන ආදායමෙන් පොලී ගෙවිය යුතු වේ. 1990 වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා ගෙවිය යුතු වූ පොළිය වර්ෂයකට සියයට 11.5 ක් විය.

## සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් පොත්වල ශේෂයන් සටහන් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් පොත්වල ශේෂය සටහන් කිරීම, 1990 ඔක්තෝබර් මාසයේ දී කම්කරු කොමසාරිස් විසින් අත්හිටුවන තෙක් ක්‍රියාත්මක විය. සාමාජිකයාගේ නම සඳහන් කරමින් 1989 සඳහා ගිණුම් විස්තර වාර්තා ගිණුම් පොත්වල වාර්තා කිරීම වෙනුවට 1990 දී ශේෂයන් සටහන් කිරීම කරන ලදී.

**සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය**

1988 දී සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමෙන්, දායකයන්ගේ ගිණුම්වල බැරම ඇති ශේෂයෙන් සියයට 75 දක්වා ණය දෙන ආයතනවලින් නිවාස ණය මුදල් ලබා දී ඇත. මෙය සඳහා සාමාජිකයාගේ බැරට ඇති ශේෂය පිළිබඳව සහතික කරමින් විමසුමට ලක්වන වර්ෂය තුළදී සහතික 35,798 ක් නිකුත් කළ අතර එය 1989 නිකුත් කළ සහතික 29,156 සමඟ සැසඳේ.

අරමුදලෙහි මෙහෙයවුම් කටයුතු පිළිබඳව සංසන්දනාත්මක ප්‍රකාශනයක් දැනට තිබෙන දත්ත පදනම් කරගෙන 2.9 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

**2 . 9 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථ සාධක අරමුදල් සංඛ්‍යාන 1989 – 1990**

| | 1989 | 1990 |
|---|---|---|
| 1. ලැබුණු දායක දීමනා (රුපියල් දශ ලක්ෂ) .. | 3,022 | 3,909 (අ) |
| 2. ආයෝජන (රුපියල් දශ ලක්ෂ) .. | 8,897 | 11,045 (ආ) |
| 3. ආයෝජන වලින් ලද ආදායම (රුපියල් දශ ලක්ෂ) .. | 3,426 | 4,188 |
| 4. ප්‍රතිලාභ ආපසු ගෙවීම් (රුපියල් දශ ලක්ෂ) .. | 633 | 1,209 |
| 5. ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව .. | 26,287 | 44,813 |
| 6. පොළී අනුපාතිකය (%) .. | 11% | 11½% |
| 7. සාමාජික ශේෂයන් සඳහා පොළී වෙන් කිරීම .. | 3,339 | 4,174 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අවිනිශ්චිත ගිණුම්වලට බැර කළ දායක මුදල් හැර.

(ආ) රජයේ සුරැකුම්පත්වල ප්‍රති – ආයෝජනය කළ කල් පිරුණු ද්‍රේෂණ ඵලයන් හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ මුදල් ද ඇතුලත්ය.

## විනිමය පාලන

1990 වර්ෂය තුළදී මහ බැංකුව විසින් විනිමය පාලන කටයුතුවල පහත දක්වෙන වෙනස්කම් සිදුකරන ලදී.

1. ආනයන

(අ) නිෂ්පාදන බැඳුම්කර යෝජනා ක්‍රමය යටතේ අමු ද්‍රව්‍ය ආනයනය කිරීම.

ණයවර ලිපි විවෘත නොකර ගෙවීම් මත ලේඛන පිළිගැනීම (ඩී/පී) සහ දින 120 ක අත්හිටවූ ගෙවීම් (ඩී/ඒ) පදනම් කරගෙන නිමි ඇඟලුම් අපනයන කර්මාන්තයේ නියුතු නිෂ්පාදකයින් හට ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම උදෙසා අත්හද බැලීමක් වශයෙන් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදි. (90.01.23 දින සහ අංක ඊසී/4/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්) පසුව මෙය ඔප දමූ මැණික් ගල් අපනයන කර්මාන්තයට අවශ්‍ය, දියමන්ති හැර, අනෙකුත් දළ මැණික් ගල් ආනයනය කිරීම දක්වා දින 90 කට අඩුකළ කාලසීමාවක් සහිතව දික් කරන ලදී. (90.01.26 දින සහ අංක ඊසී/5/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ආ) පාවිච්චි කරන ලද මෝටර් සයිකල්

ප්‍රථම ලියාපදිංචියේ සිට වසර 3 කට වඩා පැරණි පාවිච්චි කරන ලද මෝටර් සයිකල් ආනයනය අත්හිටුවීමට කොන්දේසියක් පණවන ලදී. (90.03.07 දින සහ අංක ඊසී/17/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්) පාවිච්චි කරන ලද මෝටර් සයිකල් ආනයනය 1990.07.11 දින සිට මුළුමනින්ම තහනම් කළද, පසුව අවම වශයෙන් වසර 3 ක කාලයක් පාවිච්චි කළහැකි බවට තහවුරුවක් සහ ධාවනයට සුදුසුයැයි සහතික කෙරෙන පැටවුම් වරායේ සමාලෝචන වාර්තාවක් ආනයනකරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය යන නව කොන්දේසි මත මෝටර් සයිකල් ආනයනය කිරීම සඳහා නැවත වරක් ඉඩ සලසන ලදී (90.07.19 දින සහ අංක ඊසී/42/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්) කෙසේවුවද, මෙම පැටවුම් වරායේ සමාලෝචන වාර්තාවේ අවශ්‍යතාවයද පසුව ඉවත්කරන ලදී (90.11.14 දින සහ අංක ඊසී/69/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ඇ) ආනයන සහ අපනයන පාලකගේ බලපත්‍රයක් නොමැතිව ප්‍රතිසංස්කරණය කරන ලද බස්රථ ආනයනය කිරීමට අවසර දෙන ලදී. එම අවසරය දෙන ලද්දේ රු. 250,000ක මිල මට්ටමකට ආසන්න එමෙන්ම 30–40 අතර මගී ධාරිතාවකින් යුත් ප්‍රථම ලියාපදිංචියේ සිට වසර 10 කට වඩා නොපැරණි බස් රථ විය යුතුය යන කොන්දේසියක් ණයවර ලිපියෙහි අඩංගු කිරීමෙනි. (90.07.10 දින සහ අංක ඊසී/37/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්) එහෙත් රු. 250,000 මිළ සීමාව 1990.08.31 දින ඉවත් කරන ලදී.

(ඈ) ආහාර ද්‍රව්‍ය

නැව්ගත කරන ලද ආහාර ද්‍රව්‍ය ඍජු මානව පරිභෝජනය සඳහා යෝග්‍යය, යනුවෙන් සහතික කරනු ලබන පැටවුම් වරාය සමාලෝචන වාර්තාවක් අවශ්‍යයැයි අඩංගු ඡේදයක් සියලුම ආහාර ද්‍රව්‍ය ආනයනය කරන ණයවර ලිපිවලට ඇතුළත් කළ යුතුයැයි බලයලත් වෙළෙඳුන් වෙත දන්වන ලදී (1990.01.08—ඊසී/1/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

(ඉ) ට්‍රැක්ටර්

ට්‍රැක්ටර් ආනයනය කිරීමේදී තිබූ " වසර 5 කට වඩා නොපැරණි විය යුතු " යන කොන්දේසිය වසරක කාල පරිච්ඡේදයක් සඳහා ඉවත් කරන ලදී (1990.11.30—ඊසී/73/90(බී) දරන මෙහෙයවුම් උපදෙස්)

2. අපනයන

(අ) ගෙවීම් ක්‍රම

සෝවියට් දේශය සඳහා වූ තේ, රබර්, සහ කොහු නිෂ්පාදන වෙනුවෙන් කළ, මිළට ගැනීම් සහ විකුණුම් අපනයන කළ දින සිට දින 360 දක්වාවූ අත්හිටවූ ගෙවීම් ලෙස සැළකීමට පිළිවෙලින් 1990.07.06 සහ 90.07.12 යන දිනවල අවසර දෙන ලදී.

(ආ) අපනයන ඉපැයුම් මත කොමිස් ගෙවීම

භාණ්ඩ ගැණුම්කරු ඒජන්ත ලෙසද පෙනී සිටින අවස්ථාවේදී විකුණුම් ප්‍රතිලාභ ලැබීමට පෙර කොමිස් වශයෙන් නැ. වි. ස. (එෆ්.ඕ.බී.) වටිනාකමින් 5% දක්වා වූ මුදලක් අඩුකර ගැනීමට විරෝධයක් නොමැත (90.04.23–ඊසී/28/90 එච්. පී. සී.) දරන මෙහෙයවුම් උපදෙස්)

**3. චාරිකා**

ශ්‍රී ලංකා නේවාසිකයනට රුපියල් ගෙවීම් මත ව්‍යාපාරික පංතියේ ගුවන් ගමන් බලපත් නිකුත් කිරීමට සියලු ගුවන් සේවාවන්ට අවසර දෙන ලදී. (90.10.10—ඊසී/62/90(කේ) දරන මෙහෙයවුම් උපදෙස්) අදාළ 'සී' පෝරම අනුමත කිරීමට බලයලත් වෙළෙඳුනටද අවසර දෙන ලදී. (90.10.16—ඊ.සී/63/90 (කේ) දරණ මෙහෙයවුම් උපදෙස්.) අනේවාසික විදේශ මුදල් ගිණුම්වල මුදල් වලටද යාන ප්‍රවේශපත්‍ර අනුමත කිරීමට ඔවුනට අවසර දෙන ලදී.

පිටරට සංචාරයන්හි යෙදෙන අයට, අපනයන හෝ ආනයන කිරීමට අවසරය දී තිබූ ශ්‍රී ලංකා රුපියල් 250 ක මුදල් ප්‍රමාණය රු. 1,000 දක්වා වැඩි කරන ලදී. (90.12.17—ඊසී/77/90(කේ) දරන මෙහෙයවුම් උපදෙස්)

සංචාරක කටයුතු සඳහා විදේශ මුදල් බැංකු ඒකකයෙන් ලබාගත හැකි විදේශ මුදල් නෝට්ටු ප්‍රතිශතය සියයට 20 සිට සියයට 50 දක්වා වැඩි කරන ලදී (90.12.17—ඊසී/78/90(ඩී) දරන මෙහෙයවුම් උපදෙස්)

එ. ජ. ඩොලර් 5,000 නොඉක්මවන මුදල් රැගත් විදේශ ගමන් බලපත්ධාරීනට රේගු ප්‍රකාශනයක් කිරීම අනවශ්‍ය බව රේගු මහාධ්‍යක්ෂ වෙත දන්වන ලදී.

**4. අධ්‍යාපන**

උපාධි අපේක්ෂක, වෘත්තීමය සහ තාක්ෂණික පාඨමාලා හැදෑරීම සඳහා එක්සත් රාජධානියට යන ශිෂ්‍යයින්ගේ පමණක් ජීවන වියදම් දීමනා වසරකට ර. ප. 3,120 සිට ර. ප. 4,500 දක්වාත්, පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමේදී වසරකට ර. ප. 3,840 සිට ර. ප. 4,800 දක්වාත් වැඩි කරන ලදී. (1990.09.13 දින සහ ඊසී/54/90(ඊ) අංක දරන මෙහෙයවුම් උපදෙස්)

**5. ඉරාක සහ කුවේට් බැංකු ගිණුම් ඇවිරීම**

සියලුම ඉරාක රජයේ සහ තත් ඒජන්සි ආයතන මගිනුත්, කුවේට රාජ්‍යය ඒජන්සි ආයතන මගිනුත් පවත්වාගෙන යනු ලබන මෙරට සහ නේවාසික විජාතික විදේශ මුදල් ගිණුම් ගනුදෙනු ඇවිරීම කිරීමට බලයලත් වෙළෙඳුන්ට උපදෙස් දෙන ලදී (90.02.31—ඊසී/50/90(ඩී) දරන මෙහෙයවුම් උපදෙස්) විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලත් පිළිගත් තානාපති නිලධාරීන් හැරුණුවිට අනෙක් සියලුම පුද්ගලයින්ගේ පෞද්ගලික ව්‍යවසායයන් සහ ගිණුම් දක්වා මෙම ඇවිරීම දිගු කරන ලදී (90.09.05-ඊසී/51/90(ඩී) දරන මෙහෙයවුම් උපදෙස්)

**6. අනේවාසික විදේශ මුදල් ගිණුම්**

ස්වකීය සේවා සඳහා ලැබෙන කොමිස් ඉපැයුම් සහ ගාස්තු බැර කිරීමට හැකිවන අයුරින් විදේශයන්හි රැකියා සඳහා සේවකයින් බඳවා ගනු ලබන මෙරට රැකියා ඒජන්සිකරුවනටද මෙම පහසුකම දිගු කරන ලදී (90.03.30—ඊසී/22/90(ඩී) දරන මෙහෙයවුම් උපදෙස්)

**7. ආයෝජන**

විදේශ රටවලට අයත් අප විසින් අනුමත කර ඇති අරමුදල් වලින් සහ කලාපීය අරමුදලින් මෙන්ම අනේවාසික පුද්ගලයින් විසින්ද (විදේශ ගත ශ්‍රී ලාංකිකයින් ඇතුළුව) කොටස් ව්‍යාපාර වස්තු හුවමාරු මධ්‍යස්ථාන විසින් නිකුත් කරන ලද ප්‍රාග්ධනයේ සියයට 40 දක්වා කොටස්හි ආයෝජනය කිරීමට ඉඩ දීමක් වශයෙන් විනිමය පාලන පනතේ අංක 10, 11 සහ 15 දරන ඡේද යටතේ පොදු අවසරයක් දෙන ලදී. එමෙන්ම මෙම ආයෝජනයන්හි සියළුම විකුණුම් ප්‍රතිලාභ බදුවලට යටත්ව එහෙත් විනිමය පාලකගේ පූර්ව අනුමැතියකින් තොරව ආපසු පිටරට යැවීමටද අවසර දීමට තීරණය කරන ලදී.

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන් රාජ්‍ය ණය පරිපාලනය තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යනු ලැබීය. මේ සම්බන්ධයෙන් රජයේ සුරැකුම්පත් ණය, භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතිකපත් සහ භාණ්ඩාගාර තැන්පතු සහතික පත් සහ රජයේ ' විදේශ ණය ' සේවාකරණය පවත්වාගෙන යාම ප්‍රධාන කාර්යයන් විය. තවදුරටත්, රාජ්‍ය ණය පිළිබඳව හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිළිබඳව දත්ත බැංකුවක් පවත්වාගෙන යාම ද කරන ලදී.

1990 අවසානය වන විට නොපියවා තිබූ දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 315,533 ක් වූ අතර එය වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 40,110 ක වැඩිවීමක් පෙන්නුම් කිරීමකි. මෙම වැඩි වූ ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 8,508 ක් හෝ සියයට 21 ක් විදේශ විනිමය අනුපාතයේ අගය හීන වීම හේතුකොටගෙන සිදුවිණි. නොපියවා තිබූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 56 ක් විදේශීය ණය වූ අතර දේශීය ණයවල කොටස සියයට 44 ක් විය.

අයවැය අවශ්‍යතා සපුරාලීම සඳහා වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 12,847 ක රුපියල් සුරැකුම් පත් නිකුත් කරන ලදී. 1990 වර්ෂය තුළ රුපියල් ණය ආපසු ගෙවීම් මුළු ප්‍රමාණය සහ පොළිය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 7,854 ක් හා රුපියල් දශ ලක්ෂ 6,857 ක් විය. වසර අවසාන වන විට නොපියවා තිබුණු මුළු රුපියල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 59,209 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 4,532 ක් ආරක්ෂක බැඳුම්කර වලින් සමන්විත විය. කලින් වර්ෂවල මෙන්, 1990 වර්ෂයේදී ද සේවක අර්ථසාධක අරමුදල රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයා වූ අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 64 කි. 1990 දී, ජාතික ඉතිරි කිරීමේ බැංකුව මුළු ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 3,392 ක් හෝ සියයට 26 ක් සපයමින් විශාල වශයෙන් දායක වූ අතර එය කිසිදු දායකත්වයක් නොවූ 1989 වර්ෂය සමඟ සැසඳේ.

භාණ්ඩාගාර බිල්පත් සඳහා වන අනුදත් සීමාව 1990 ඔක්තෝබර් 29 ද රුපියල් දශ ලක්ෂ 65,000 සිට රුපියල් දශ ලක්ෂ 90,000 දක්වා වැඩි කරන ලද අතර, වසරේ ඉතිරි කාලය තුළ එහි වෙනසක් සිදු නොවිය. කල්පිරීමේ කාලසීමාව මාස 3, මාස 6 සහ මාස 12 සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී. එසේම 1990 වර්ෂයේ අප්‍රේල්, සැප්තැම්බර් හා දෙසැම්බර් යන මාසවලදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාස 3 ට වඩා අඩු කාලපරිච්ඡේදයකින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් ද ඒ සමඟ නිකුත් කරන ලදී. ප්‍රාදේශීය කාර්යාලවලට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව පූර්ව නිශ්චිත මිලක් යටතේ නිකුත් කිරීමේ ක්‍රමය අනුව ජනතාව වෙත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ බලය ලත් වාණිජ බැංකු හා මුදල් තැරැව්කරුවන් මාර්ගයෙන් තවදුරටත් මහ බැංකුව විසින් කොළඹ ආයෝජකයින්ට ද ව්‍යාප්ත කරන ලදී. සමාලෝචනයට ලක්වන කාලය තුළ, ජනතාව අතර භාණ්ඩාගාර බිල්පත් ජනප්‍රිය කරවීමේ කටයුතු තවදුරටත් කරගෙන යන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාථමික වෙළෙඳ පොළේ මහ බැංකුව දරූ කොටස 1989 වර්ෂයේ සියයට 60 සිට 1990 වර්ෂයේ සියයට 45 දක්වා අඩු විය.

වර්ෂය අවසාන වන විට, නොපියවා තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 67,968 ක් විය. වර්ෂය තුල ගෙවූ මුළු පොලී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,564 ක් විය. මහ බැංකුව සහ පෞද්ගලික අංශය විසින් 1990 දී මිළදී ගත් නව නිකුතුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 11,000 ක් විය.

1990 මැයි මස 23 ද සිට, මහ බැංකුව මාස 6, මාස 12 සහ මාස 24 කින් කල් පිරෙන භාණ්ඩාගාර තැන්පතු සහතික පත් නිකුතුව ආරම්භ කරන ලදී. 1990 අවසාන වන විට නොපියවා තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 109 ක් විය.

1990 දී රජය විසින් ලබා ගන්නා ලද මැදිකාලීන හා දිගුකාලීන විදේශ ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 16,945 ක් වූ අතර, ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 4,862 ක් විය. විදේශ ණයවල ව්‍යාපෘති ණය ප්‍රමාණය සියයට 74.8 ක් වූ අතර ඉතිරි ප්‍රමාණය ව්‍යාපෘති නොවන ණය නියෝජනය කරන ලදී. විදේශීය ණය සඳහා මුළු පොළී ගෙවීම් හා අනිකුත් ගාස්තු 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 3,678 ක් විය.

## ප්‍රාදේශීය කාර්යාල – මාතර, අනුරාධපුර සහ මාතලේ

ග්‍රාමීය සංවර්ධනයෙහිලා මහ බැංකුව සතු කාර්යභාරය ඉදිරියට ගෙන යමින් එහි මාතර, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල, 1990 වර්ෂය තුළදී සිය සංවර්ධන කටයුතු වැඩි වේගයකින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1989 වර්ෂය හා සසඳන විට, 1990 වර්ෂය තුළදී රටෙහි පැවති සාමකාමී වාතාවරණය මේ සඳහා බොහෝදුරට ඉවහල් විය.

විවිධ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම යටතේ ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති අගැයීම හා එළැඹි ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා බැංකුවලට නිර්දේශ කිරීම, ව්‍යාපෘති සාර්ථකව නිම කිරීම හා ණය ආපසු ගෙවීම යහපත් මට්ටමක පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා එම ව්‍යාපෘතිවල පසු විපරම් කටයුතු සිදු කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩ සටහන් පැවැත්වීම සහ ලබාගන්නා ණය උපරිම අයුරින් යොදගැනීම සහතික කරනු වස් ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මහජනයා දැනුවත් කිරීම වැනි කාර්යයන් සඳහා ප්‍රාදේශීය කාර්යාලවල වැඩි අවධානය, 1990 වර්ෂය තුළදී යොමු කෙරිණි. මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම අතුරින් ප්‍රාදේශීය කාර්යාල වඩාත්ම අවධානයක් යොමු කරන ලද්දේ ස්වයං රැකියා හා ගම් නඟා සිටුවීමේ ණය යෝජනා ක්‍රමය සහ ඒ වෙනුවට 1990 අගෝස්තු මාසයේදී හඳුන්වා දෙන ලද දීප ව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහාය. 1990 වර්ෂය තුළදී ඒ යටතේ ලබා දී තිබූ ණය ප්‍රමාණය සැළකියයුතු ප්‍රමාණයකින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එම ප්‍රදේශවල තිබූ නොසන්සුන්තාවය සමනය වීම නිසා නැවත ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කිරීමට හැකිවීමය.

මාතර ප්‍රාදේශීය කාර්යාලය 1990 වර්ෂය තුළදී, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 8.4 වටිනා ණය ව්‍යාපෘති 1,179 ක් මූල්‍යකරණය කිරීම සඳහා බැංකු වෙත නිර්දේශ කර ඇත. මෙය පසුගිය වසරෙහි නිර්දේශිත රුපියල් දශ ලක්ෂ 2.2 වටිනා ව්‍යාපෘති 179 හා සසඳන කළ සැළකිය යුතු වැඩිවීමකි. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, මැද රට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය හා දේශීය බිල්පත් යෝජනා ක්‍රමය වැනි අනෙකුත් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ඉදිරියේදී වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන දැනුම බැංකු කරුවන්ට, මහජනතාවට හා අනෙකුත් අදාළ ආයතනවලට ලබාදීම සඳහා, සම්මන්ත්‍රණ හා වැඩමුළු කිහිපයක් ද මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 1990 වර්ෂය තුළදී පවත්වන ලදී.

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය, 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 13.6 ක් වටිනා කුඩා සංවර්ධන ව්‍යාපෘති 756 ක් ස්වයං රැකියා හා ගම් නඟා සිටුවීමේ ණය යෝජනා ක්‍රම යටතේ වාණිජ බැංකුවලට නිර්දේශ කළේය. 1989 වර්ෂය තුළදී මේ යටතේ නිර්දේශ කරන ලද්දේ රුපියල් දශ ලක්ෂ 4.3 ක් වටිනා මුළු ව්‍යාපෘති 297 කි. නිර්දේශිත මුළු ණය ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 612 ක් හෙවත් සියයට 80 ක් කෘෂිකර්මය ආශ්‍රිත කටයුතු සඳහා වන අතර ව්‍යාපෘති 84 ක් හෙවත් සියයට 11 ක් සත්ව පාලන කටයුතු සඳහා විය. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් ලොකු එළු වගාව නඟා සිටුවීම සඳහා අත්හද බැලීමේ පදනමක් මත විශේෂ ව්‍යාපෘතියක් 1990 යල කන්නයේදී ක්‍රියාත්මක කළේය.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය 1990 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 8.5 ක් වටිනා ස්වයං රැකියා ව්‍යාපෘති ණය 542 ක් බැංකු වෙත නිර්දේශ කර ඇති අතර පසුගිය වර්ෂයේ නිර්දේශ කරන ලද රුපියල් දශ ලක්ෂ 2.9 ක් වටිනා 259 ක් වූ ණයදීම් සංඛ්‍යාව සමඟ සසඳන කල එය සියයට 109 ක වැඩිවීමකි. මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ගම්මාන තුනක ආර්ථික දියුණුව උදෙසා සත්ව පාලන විශේෂ ව්‍යාපෘතියක් මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලදී. 1990 වර්ෂය තුළදී, රුපියල් දශ ලක්ෂ 2 ක් වටිනා සත්ව පාලන ව්‍යාපෘති ණය 143 ක් මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් බැංකුවලට නිර්දේශ කරන ලදී. 1989 වර්ෂය තුළදී මේ යටතේ නිර්දේශ කර ඇත්තේ රුපියල් දශ ලක්ෂ 0.8 ක් වටිනා ව්‍යාපෘති 61 ක් පමණකි. දීප ව්‍යාප්ත ගොවිපල යන්ත්‍රෝපකරණ ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 1.1 ක් වටිනා ව්‍යාපෘති 65 ක්ද ප්‍රාදේශීය කාර්යාල විසින් බැංකුවලට නිර්දේශ කර ඇත. මෙම ණය වලින් වැඩි කොටසක් ජනසවිලාභීන්ට, ඵලදායී කෘෂිකාර්මික ව්‍යාපෘතිවල නියැලීමට අවශ්‍ය වතුර පොම්ප මිළදී ගැනීම සඳහා විය. මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් ද යල කන්නයේදී ලොකු එළුණු වගා කිරීම සඳහා ණය මුදල් සැපයීම සහ එම එළුණු සාධාරණ මිළකට අලෙවි කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානයෙන් යුතුව කටයුතු කළේය. මෙම කාර්යාලය, කුඩා තේ වතු සංවර්ධන ණය ව්‍යාපෘතියට අදල ක්ෂේත්‍ර පරීක්ෂණ 68 ක් සිදු කළ අතර ඒ යටතේ ණය අයදුම්පත් 38 ක් මූල්‍යකරණය සඳහා බැංකු වෙත නිර්දේශ කළේය.

පෙර මෙන්ම, කෘෂිකාර්මික ණය දීම සඳහා ' ණය කඳවුරු ' පැවැත්වීම ප්‍රාදේශීය කාර්යාල විසින් තවදුරටත් කරගෙන යන ලදී. 1990 වර්ෂය තුළදී අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල විසින් පිළිවෙලින් ණය කඳවුරු 2ක් හා 10ක් ඔවුන්ගේ බල ප්‍රදේශයන්හි පවත්වන ලදී.

ප්‍රමුඛතා අංශවලට වැඩි ණය පහසුකම් සැපයීමේ කටයුතුවලට අමතරව, ග්‍රාමීය ගොවි ජනතාවට ප්‍රශස්ථ නිෂ්පාදනයක් ලබාගැනීමට අවශ්‍ය වන ඵලදායී කෘෂිකාර්මික ක්‍රම පිළිබඳව සහ ග්‍රාමීය ගොවි ජනතාවගේ දැනුම හා තාක්ෂණ නිපුණතාවයන් උසස් කරලීම සඳහා, ප්‍රතිලාභී පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වන ලදී.

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළ, අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් " ජනහමු " 30 ක් හා කෘෂිකාර්මික පුහුණු පන්ති 24 ක් පවත්වන ලදී. මාතලේ ප්‍රාදේශීය කාර්යාලය සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා 11 ක් පවත්වා ඇති අතර එයින් 8 ක් ප්‍රධාන වශයෙන් ජනසවිලාභීන් සඳහා වූ ඒවා විය. තවද, ග්‍රාමීය මට්ටමේදී ස්වයං රැකියා ව්‍යාපෘති කෙරෙහි ණය පහසුකම් ගලායෑමේ අවහිරතා සම්බන්ධ ගැටළු හඳුනාගැනීම පිණිස ගම් මට්ටමේ රැස්වීම් 17 ක් පවත්වන ලදී.

1990 වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාල තුන විසින් අදළ මහ බැංකු නිලධාරීන්ගේ සහ එම ප්‍රදේශවල වාණිජ බැංකු නියෝජිතයන්ගේ සහභාගීත්වය ඇතිව, ණය ලබාදීමේදී පැන නගින ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම පිණිස රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් වාණිජ බැංකුවලද සහයෝගය ඇතිව ග්‍රාමීය ප්‍රදේශවලට වැඩි ණය පහසුකම් සැලසීම සඳහා උපකාරී වන අන්දමේ වැඩපිළිවෙලක් සකස් කරගැනීමට හැකි විය. තවද, මෙම වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාල තම ප්‍රදේශවල පැවැත්වූ ජංගම ජනාධිපති සේවාවන් හා අමාත්‍යාංශ සේවාවන් සඳහා සහභාගී වී ඒවා සාර්ථක කර ගැනීම සඳහා බැංකුවෙන් සැලකිය යුතු සේවාවක් ඉටු කරන ලදහ.

ජනසවියේ පළමු වටය ක්‍රියාත්මක වීමත් සමඟ ජනසවිලාභීන්ට ස්වයං රැකියා අවස්ථා උත්පාදනය කරදීම කෙරෙහි බැංකුවේ අවධානය යොමු කර ඇත. මෙම කර්තව්‍යයෙහි ලා, ජනසවිලාභීන් දැනුවත් කිරීමට හා උනන්දු කිරීමට මෙන්ම ඔවුනට ණය ලබාගැනීමේදී මුහුණ පෑමට සිදුවන ගැටළු හඳුනාගැනීමට ගම් මට්ටමේ රැස්වීම්/වැඩ මුළු සංවිධානය කිරීම සඳහා

ප්‍රාදේශීය කාර්යාල දිරිමත් කරවන ලදී. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය මෙවැනි රැස්වීම් 7 ක් පවත්වා ඇති අතර මාතර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාලද ජනසවිලාභීන් සඳහා තම ප්‍රදේශවල පුහුණු පාඨමාලා කිහිපයක්ම පවත්වා ඇත. තවද, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල දෙකෙන් පිළිවෙලින් ජනසවිලාභීන් සඳහා වූ ව්‍යාපෘති 97 ක් හා 371 ක් මූල්‍යකරණය සඳහා බැංකු වෙත නිර්දේශ කළහ.

තම ප්‍රදේශවල පිහිටා ඇති වාණිජ බැංකුවල හා මහජනතාවගේ ව්‍යවහාර මුදල් අවශ්‍යතා සපුරාලනු වස් 1990 ජූනි මස 01 දින හා ජූලි මස 02 වන දින පිළිවෙලින් අනුරාධපුර හා මාතර ප්‍රාදේශීය කාර්යාල විසින් තම ව්‍යවහාර මුදල් කටයුතු ආරම්භ කරන ලදී. මේ යටතේ විශේෂයෙන්ම, අළුත් නෝට්ටු ලබාදීම සඳහා ආරම්භ කර ඇති කවුළු, එම ප්‍රදේශයෙහි වෙළෙඳාමේ නිරත අය අතර මෙන්ම සාමාන්‍ය මහජනයා අතරද බෙහෙවින් ජනප්‍රිය වී ඇත. තවද එමගින් ප්‍රදේශයේ පිහිටා ඇති බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවලට, වර්ධනය වන තම ව්‍යවහාර මුදල් අවශ්‍යතා සපුරාගැනීම සඳහාත්, අතිරික්ත මුදල් සඳහා ආරක්ෂිත තැන්පතු පහසුකම් සළසා ගැනීම සඳහාත් ප්‍රයෝජනවත් සේවයක් ලබාදෙයි.

ප්‍රාදේශීය කාර්යාල විසින් 1990 වර්ෂය තුල භාණ්ඩාගාර බිල්පත් විකිණීම තවදුරටත් කරගෙන යන ලදී. මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පසුගිය වසර හා සසඳන කල සියයට 22 ක වැඩිවීමක් පෙන්වමින්, 1990 වසරේදී, රුපියල් දශ ලක්ෂ 127 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් අලෙවි කරන ලදී. අනුරාධපුර හා මැතලේ ප්‍රාදේශීය කාර්යාල පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,585 ක් හා රුපියල් දශ ලක්ෂ 1,723 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් විකුණුහ. මෙය 1989 වසර හා සසඳන කල පිළිවෙලින් සියයට 36 ක හා සියයට 44 ක අඩුවීමක් පෙන්නුම් කරයි.

මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල විසින් වාණිජ බැංකු සඳහා පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන කටයුතු 1990 වර්ෂය තුලදී තවදුරටත් වර්ධනය කරනු ලැබීය. මාතර පිහිටි ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශනාගාරය විසින් රුපියල් දශ ලක්ෂ 1,390 ක් වටිනා චෙක්පත් 100,508 ක් නිෂ්කාශනය කළ අතර අනුරාධපුර නිෂ්කාශනාගාරය රුපියල් දශ ලක්ෂ 1,192 වටිනා චෙක්පත් 69,615 ක් නිෂ්කාශනය කළේය. මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධිත මහනුවර හා මාතලේ නිෂ්කාශනාගාරය මගින් 1990 දී රුපියල් දශ ලක්ෂ 6,612 වටිනා චෙක්පත් 312,247 ක් නිෂ්කාශනය කරන ලදී.

## ප්‍රවෘත්ති හා ප්‍රකාශන

ප්‍රවෘත්ති රැස්කිරීම, ඒකරාශිකර තැබීම හා බෙදහැරීමේ කාර්යභාරය ඉටු කරමින්, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ප්‍රවණතා, සංවර්ධන ප්‍රයත්නයන් සඳහා වන උපාය මාර්ග හා ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව ලබාදෙන සහාය පිළිබඳ දත්තයන් හා ප්‍රවෘත්ති සැපයීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන ගියේය. බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද පොත්පත් හා වාරික, මහජනතාව හා ජනමාධ්‍ය වෙත මෙම දැනුම ලබාදීමෙහි ලා බෙහෙවින් ප්‍රයෝජනවත් විය. මහ බැංකු පුස්තකාලය මගින් වර්ෂය තුළ දී එය සතු ප්‍රකාශන සම්භාරය වැඩි කරවමින් පොත්පත් හා පත්‍රිකා 970 ක් ඊට එක් කළ අතර, වාර ප්‍රකාශන 502 කට දායක වූයේය.

බැංකුව විසින් විසින් පහත සඳහන් ප්‍රකාශන 1990 වර්ෂය තුළදී පළකරන ලදී.

(1) මුදල් නීති පනතේ 35 (i) වගන්තියේ ප්‍රකාර පළකරන ලද 1989 වාර්ෂික වාර්තාව මුදල් ඇමති වෙත පිළිගන්වන ලදී. මෙම වාර්තාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළකර ඇත.

(2) 40 වැනි සාංවත්සරික සැමරුම් ග්‍රන්ථය: පසුගිය හතළිස් වසර තුළ මහ බැංකු කටයුතු, වාණිජ බැංකු කටයුතු සහ ආයතනික ප්‍රගතීන් පිළිබඳ ලිපි කිහිපයක්ම මෙම ප්‍රකාශනයේ අඩංගු වී ඇත,

(3) ආර්ථික සමීක්ෂණය—1990 ප්‍රථම භාගය

(4) සමාජ ආර්ථික දත්ත පත්‍රිකා එකතුව—1990

(5) මාණ්ඩලික පත්‍රිකා—වෙළුම 17 අංක 1 සහ 2
වෙළුම 18 අංක 1 සහ 2

(6) මාසික විවරණිකාව—සිංහල, දෙමළ, ඉංග්‍රීසි

(7) වැදගත් ආර්ථික සිද්ධීන් පිළිබඳ තොරතුරු ඇතුළත් වන "ඉකොනොමික් බුලටින්" ද්විමාසික ප්‍රකාශනය

(8) " සටහන " හා " නිව්ස් සර්වේ " මාසිකය

(9) 1990 ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රගතීන්

(10) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංඛ්‍යාලේඛන 1988–89

(11) ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු තොරතුරු

(12) කාලීන පත්‍රිකා අංක 20—ජනතාවගේ අවශ්‍යතා පිරිමැසීම සඳහා බැංකු ප්‍රතිපත්තිය යළි සැකසීම.

(13) " බැංකු පුවත් "

බැංකුව විසින් අභිනවයෙන් හඳුන්වා දුන් ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පැවැත්වූ ජන මාධ්‍ය සාකච්ඡා සහ නිකුත් කළ පුවත්පත් නිවේදන සංඛ්‍යාව වැඩි වූ අතර, ඒ මගින් බැංකුව, ජන මාධ්‍ය සමඟ ඉතා සමීප සබඳතාවයන් නොකඩවා පවත්වාගෙන යන ලදී.

වඩාත් පුළුල් පාඨක පිරිසකට සමීප විය හැකි අයුරින්, බැංකුව විසින් ප්‍රසිද්ධ පොත් වෙළෙඳ ආයතන හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාර්යාල ද උපයෝගී කරගනිමින් සිය ප්‍රකාශන විකිණීමේ ක්‍රියාදමය පුළුල්කර ඇත.

## පර්යේෂණ කටයුතු

1990 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් විසින් පහත සඳහන් පර්යේෂණ අධ්‍යයනයන් අවසන් කරන ලදී.

1. ශ්‍රී ලංකාවේ අත්දැකීම් ආශ්‍රයෙන් වර්ධනය සහ ගැලපීම් සඳහා වන මූල්‍ය හා මූල්‍ය ප්‍රතිසංස්කරණ අනුමිතීන්.

2. යුරෝපීය තනි වෙළෙඳපොළ ශ්‍රී ලංකාවට ඇති කරන බලපෑම්.

3. ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිසංස්කරණ, 1977–1987.

4. ශ්‍රී ලංකාවේ අපනයන සහ ආර්ථික වර්ධනය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ ප්‍රායෝගික විමසුමක්.